# සත්‍යග්‍රහ - උපවාස- මාරාන්තික උපවාස



1963 වසරේ දී ක්වාන් ඩාක් නම් වියට්නාම් බෞද්ධ හිමියන් සයිගොන් නගරයේ දී තම සිරුරට ගිනිතබාගත් අවස්ථාව



උපවාසයේ යෙදී මියගිය අයිරිෂ් ජාතික බොබී සැන්ඩ්ස්



LTTE සාමාජිකයෙකුවූ දිලීපන් 1987 දි ඇරඹූ මාරාන්තික උපවාස යේ දී ඔහු හමුවන්නට පැමිණි ප්‍රභාකරන් කතාබහේ යෙදී සිටී.

**දේ**ශපාලනමය, වෘත්තිමය මෙන්ම පොදු හා පෞද්ගලික අරමුණු උදෙසා උපවාස හා සත්‍යග්‍රහ පැවැත්වීමේ ප්‍රවණතාවක් ශ්‍රීලංකාවේ දක්නට ඇත. මෙය වඩාත් තීව්‍ර ලෙස පෙනෙන්නට වූයේ පසුගියදා අමාත්‍ය විමල් වීරවංශ මාරාන්තික උපවාසයක නිරතවීම නිසා ය.

කිසියම් ඉල්ලීමක් ඉටුවෙන තුරු ආහාර නොගෙන සිටීම උපවාසය හෝ සත්‍යග්‍රහය ලෙස අර්ථ දක්වති. මෙයට නොයෙක් යෙදුම් සහ විග්‍රහ ඇතත් සරල ගැමිවහරට අනුව මාරාන්තික උපවාසය යනු “මේ දේ ඉටු නොකලොත් හෝ මේ දේ මට නොදුන්නොත් මං මැරෙනවා” යන්නයි ඉංග්‍රීසියෙන් මෙම ක්‍රියාව හඳුන්වන්නේ **self-immolation** යනු වෙනි.


අතීතයේ සිට ලොව බොහෝ රටවල උපවාස කෙරී ඇත. ඉතා ප්‍රකටම සිදුවීම වූයේ 1940 දශකයේ ඉන්දියාවේ මහත්මා ගාන්ධි බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව ඇරඹූ උපවාසය හෙවත් සත්‍යග්‍රහයයි එයට එම නම තැබුවේද ගාන්ධිමය.

ගාන්ධි එය ඇරඹූයේ Non-violence හෙවත් අවිහිංසාව මුල්කරගෙන ය. සත්‍යග්‍රහ සෑදී ඇත්තේ සංස්කෘත වචන දෙකක් වූ **සත්‍ය** සහ **ආග්‍රහ** එකතුවීමෙනි. **ආග්‍රහ** යනු යමකට තරයේ එල්ලී සිටීමයි. එය ඉංග්‍රීසියෙන් විස්තර කරන්නේ **holding firmly to truth** යනුවෙනි. නෙල්සන් මන්ඩේලා සහ මාටින් ලූතර් කිං යන දෙදෙන සිය නිදහස් ව්‍යාපාර සඳහා අනුගමනය කළේ මහත්මා ගාන්ධිගේ සත්‍යග්‍රහ පිළිවෙතයි. ආයුධ අතට නොගෙන එමගින් රාජ්‍ය පාලනයක් වෙනස්කර ගැන්ම එහි අරමුණයි.

ශ්‍රීලංකාවේ විශ්වවිද්‍යාල වලත්, සෞඛ්‍ය ක්ෂෙත්‍රය තුළත් උපවාස පැවැත්වීම ප්‍රකටය. අඛණ්ඩ උපවාස නමින් අළුත් මෝස්තරයක්ද මෑතක බිහිවී තිබේ. එහිදී සිදුවන්නේ ඒ ඒ කණ්ඩායම් මාරුවෙන් මාරුවට උපවාස කිරීමයි. එක් කණ්ඩායමක් පැය කීපයක් උපවාස කොට විවේක ගන්නා අතර, තව කණ්ඩායමක් උපවාසයට එක්වේ. මෙසේ සේවා මුර ක්‍රමයට උපවාස කොට දින 100 හෝ 200 ඉක්මවා වාර්තා තැබීමද සමහර විට සිදුවේ.

උපවාස පැවැත්වීමේ රටාව අනුව ඒවා මෙසේ වර්ග කළ හැකිය.

1. පෞද්ගලික අරමුණු සඳහා වූ පෞද්ගලික උපවාස
2. සාමුහික අරමුණු සඳහා සාමුහික උපවාස
3. පෞද්ගලික අරමුණක් සඳහා වූ සාමුහික උපවාස
4. සාමුහික අරමුණක් සඳහා පෞද්ගලික උපවාස යනුවෙනි



මහාත්මා ගාන්ධි භාරතයේ බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව පැවැත්වූ එක් නිරාහාර සත්‍යග්‍රහ අවස්ථාවක්

පෞද්ගලික අරමුණක් සඳහා පෞද්ගලිකව කරන උපවාස බහුලව ඇතත් ඉන් සමාජයට දැඩි බලපෑමක් ඇති නොවේ. තමාගේ උසස්වීම ලබාගැනීම, රැකියාවෙන් පහකිරීම, පංති තහනම ඉවත්කිරීම, උසස්වීම ලබාගැනීම ආදී පුද්ගලික දේ මේවා පිටුපස ඇත.

සාමුහික අරමුණු සඳහා උපවාස ඉඳහිට ලංකාවේ දක්නට ලැබේ. 1987 ඉන්දු ලංකා ගිවිසුමට එරෙහිව සිරිමාවෝ මැතිණියගේ ප්‍රධානත්වයෙන් කොළඹ පිටකොටුවේ පැවති උපවාසය උදාහරණයකි.

පෞද්ගලික අරමුණක් සඳහා කෙරෙන සාමුහික උපවාස විශ්වවිද්‍යාල වල බොහෝ සේ දක්නට ඇත. පංති තහනමට ලක්වූ ශිෂ්‍යයාගේ පන්ති තහනම ඉවත් කිරීම සඳහාත්, ජෙනරාල් සරත් පොන්සේකා නිදහස් කරන සේ ඉල්ලා භික්ෂූන් වහන්සේලා කළ උපවාසයත් මේ ගණයට අයත්ය.

1957 වසරේදී ශ්‍රීලංකාවේ එවක බණ්ඩාරනායක රජයේ නියෝජ්‍ය ඇමතිවරයෙකු වූ කේ. ඇම්. පී. රාජරත්න මහතා උපවාසයක් කළ ප්‍රථම ශ්‍රීලාංකික දේශපාලනඥයාය.

ඔහු සමග මහාචාර්ය එෆ්. ආර්. ජයසූරිය ලංකා පාර්ලිමේන්තුව අබියස උපවාසයක් ඇරඹූයේ ද්‍රවිඩ ෆෙඩරල් පක්ෂයේ නායක එස්. ජේ. වී. චෙල්ව නායගම් දියත් කළ උතුර සහ නැගෙණහිර එක්කිරීම සඳහා වූ පාගමනට විරෝධය පළකරමිනි. එම පා ගමන රජය විසින් තහනම් කරනු ලැබූ පසු රාජරත්න, ජයසූරිය දෙපළ උපවාසය ජයග්‍රාහී ලෙස අත්හැරිය අතර දෙදෙනම බරපතළ ලෙස රෝගාතුර වූහ.

1963 දී මුළු මහත් ලෝකයම පුදුමයට හා කම්පාවට පත් සිද්ධියක් වූයේ එම වසරේ ජූනි මස 11 දින වියට්නාමයේ සයිගොන් නගරයේදී බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් වන ක්වාන් ඩාක් හිමියන් (Quang Duc) තම සිරුරට ගිනි තබාගෙන ජීවිතක්ෂයට පත්වීමයි. උන්වහන්සේ එසේ කළේ එවක වියට්නාමයේ පැවති ඇමරිකානුන්ගේ සහාය ඇතිව බලයට පත්ව සිටි ඩින් ඩියම්ගේ රජය වියට්නාමයේ බෞද්ධයින්ට හා භික්ෂූන් වහන්සේලාට දරුණු ලෙස හිරිහැර කිරීමට එරෙහිවය. එම සිද්ධියෙන් පසු තවත් භික්ෂූන් වහන්සේලා කීප නමක්ම ගිනි තබාගෙන මිය ගිය බව අසන්නට ලැබිණ. ක්වාන් ඩාක් හිමියන්ගේ එම ක්‍රියාවේ ප්‍රථිඵලයක් වශයෙන් ඩින් ඩියම් රජය පෙරලුණු අතර ඇමරිකානු හමුදාවන්ට වියට්නාමය අත්හැර යන්නට සිද්ධ වීය.

1981 දී උතුරු අයර්ලන්තයේ ෂසර් හෙවත් **Irish Republican Army** නමැති ගරිල්ලා සංවිධානයේ සාමාජිකයෙකු වූ රොබර්ට් ජෙරාඩ් සැන්ඩ්ස් නොහොත් බොබී සැන්ඩ්ස් තමා ගිනි අවි දැරීමේ වරදට සිරකරුවෙකු ලෙස දඬුවම් විඳිමින් සිටි බෙල්ෆාස්ට් සිරගෙය තුළ නිරහාර උපවාසයක් ඇරඹීය.

අයි ආර් ඒ සංවිධානයට අයත් සිරකරුවන් ත්‍රස්තවාදීන් ලෙස නොව දේශපාලන සිරකරුවන් යන ලේබලයෙන් හැඳින්වීම සහ හිරගෙදර කිසි වැඩක් නොකර සිටීම හා සිර ඇඳුම් නැඳ සිටීම ඒ ඉල්ලීම් ය.

ඒ සියල්ල එවක බලයේ සිටි අගමැතිනි මාග්‍රට් තැචර් මහත්මියගේ රජය එක හෙළාම ප්‍රතික්ෂෙප කළාය. බොබී සැන්ඩ්ස් දිගටම මාරාන්තික නිරාහාර උපවාසය ක්‍රියාත්මක කළ අතර දින 66 කට පසු ඔහු මිය ගියේය. අයි. ආර්. ඒ. සංවිධානය යළිත් එංගලන්තය පුරා බෝම්බ පුපුරවන් නටත්, මිනිස් ඝාතනයටත් යොමුවූහ.

එල්.ටී.ටී.ඊ. සංවිධානයේ සාමාජිකයෙකු වූ රාසයියා ප්‍රතීපන් නොහොත් දිලීපන් නමැති ද්‍රවිඩ තරුණයා කළ උපවාසය ද අවසන් වූයේ ඔහුට මරණය කැඳවමිනි. 1987 සැප්තැම්බර් 15 වන දින නල්ලූර් මුරුගන් කෝවිලේ ඔහු ආහාර නොගැනීමේ උපවාසයක් ඇරඹීය. එවකට ඉන්දියානු සාම සාධක හමුදාව (IPKF) ලංකාවට විත් උතුරේ කොටි ත්‍රස්තයින් සිටින ප්‍රදේශවල කටයුතු සොයා බලමින් සෝදිසියෙන් සිටි කාලයකි.

අත්අඩංගුවේ සිටි සියළුම කොටි සාමාජිකයින් නිදහස් කළ යුතුය. රජයේ හමුදා උතුරු නැගෙණහිරින් පිට වී යා යුතුය යනු තිලීපන් ගේ ඉල්ලීමය.

1987 සැප්තැම්බර් 26 වන දින තිලීපන් මිය ගියේය. ඔහු මිය යන්නට පෙර ඉන්දියානු හමුදා මැදහත්ව ඒ උපවාසය නොනැවැත්වීම ගැන ප්‍රභාකරන් ඉන්දියානු සාම හමුදාව සමග වෛරයක් ඇතිකර ගත්තේය. එතෙක් ඉන්දියාව හා මිත්‍රත්වයෙන් සිටි ප්‍රභාකරන් එවක් පටන් ඉන්දියාවේ සතුරෙකු වීය. එසේම තිලීපන්ගේ මරණයට ඉන්දියාව වගකිව යුතු බවත් ඔහු කීවේය. ඔහු ඒ පළිය ගත්තේ බෝම්බයක් බඩ බැඳගත් කොටි සාමාජිකාවක් (ධනු) යවා 1991 මැයි මස 21 වෙනි දින චෙන්නායිහි ගමක මැති වරණ රැස්වීමකට සහභාගිවුණු අගමැති රජීව් ගාන්ධි ඝාතනය කරවීමෙනි.

ඇත්ත නැත්ත කුමක් වුවත් පසුව සමහර පත්‍ර වාර්තාවල පළවූ පුවතකින් හෙළි වූයේ තිලීපන්ට සුව කළ නොහැකි පිළිකාවක් තිබූ බවය. එයින් ඔහු මිය යන බව හොඳාකාරව දැන සිටි ප්‍රභාකරන්ලා ඔහු උපවාසයක් කරන්නට සුදුසුම පුද්ගලයා බවට තීරණය කළ බවත්, තිලීපන්ද කොහොමත් මැරෙන එකේ සිය සංවිධානය වෙනුවෙන් මැරුණා යයි පෙන්වීම වඩා උචිත යයි සිතන්නට ඇති බවද ඒ යුගයේ පළවූ ප්‍රවෘත්ති අතර වීය.

කොටින්ට සහාය දැක්වීම පිණිස තමිල්නාඩුවේ මහඇමති කරුණානිධි වරින්වර කළ මාරාන්තික උපවාස අප කාටත් මතකය. අන්තිමට එය මහා විහිළුවක් විය.

පසුගිය වසරේ ලන්ඩනයේද කොටි හිතවාදීන් වෙස්මිනිස්ටර් පාර්ලිමේන්තුව අසළ ඇරඹි මාරාන්තික උපවාසයේදී ඒ උපවාසය කළ තරුණයෙක් හොරෙන් හැම්බර්ගර් කෑ බවට බ්‍රිතාන්‍ය පොලීසිය එළි කළේය.

හොඳට පීනන්ට පුළුවන්කම ඇති ද්‍රවිඩ තරුණයෙක් මං මැරෙනවා යයි තේම්ස් නදියට පැන්නේය. එතැන ජීවිතාරක්ෂක බෝට්ටුද තිබෙන බව ඔහු හොඳින් දැන සිටින්නට ඇත. ඒ උපවාස වලින් හා උද්ඝෝෂණවලින් කිසිවෙකු මැරුණේ නැත. ලැබූ දිනුමක්ද නැත.

උපවාස නිසා සිරුරේ ඇතිවන සෞඛ්‍ය තත්වය ඉතා භයානකය. මරණීය තත්වයට පත්වන්නේද ඒ නිසාය. මේ පිළිබඳව මහා බ්‍රිතාන්‍යයේ සේවය කරන ශ්‍රීලාංකික ජ්‍යෙෂ්ඨ වෛද්‍යවරියක් අපට පවසා සිටියේ කෙනෙකුට දියර අහරවත් නොමැතිව සන්සුන් ලෙස සිටිය හැක්කේ පැය 15 ක් පමණ කාලයක් බවය. ඉන් පසුව විජලනය (dehydration) ආරම්භ වෙනවා ඇත. සිරුරේ පැවැත්මට අවශ්‍ය ආහාර හෝමෝන අක්මාව (liver) මගින් නිකුත් කරන නමුදු අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියාවලිය සිදු නොවේ. ඒ නිසාම වකුගඩු (kidney) අක්‍රියවීම ආරම්භ වෙනවා ඇත. පැය 48 පමණ වන විට වකුගඩු හානිවීම පටන්ගන්නවා ඇත. පැය 72 කට ආසන්න වෙත්ම උපවාස කළ පුද්ගලයා සිහි සුන්ව කෙඳිරි ගාමින් සිහි මූර්ඡා වන්නේය. ඉන්පසුව ඒ ඒ සිරුරු වල ඇති උත්තේජක ප්‍රතික්‍රියා අනුව හා ශක්තිමත් බව අනුව මරණය සිදුවේ. මෙවැනි සෞඛ්‍ය තොරතුරු නිසා සැබෑ ලෙෂ උපවාස කරන්නන් හඳුනා ගත හැකිය.

1957 දී උපවාස කළ රාජරත්න මහතා හා මහාචාර්ය ජයසූරිය මහතාද ජීවිතයේ අවසන් කාලය දක්වා වකුගඩු රෝගයෙන් පීඩා විඳි බව ඉහත සඳහන් කළෙමි.

පෞද්ගලික කාරණා මත කෙරෙන උපවාස වලට වඩා සාමුහික හේතු මත කෙරෙන උපවාස වඩා වැදගත්ය. මේ අනුව අමාත්‍ය විමල් වීරවංශ මහතාගේ උපවාසය අගය කළ යුතුය. එහි අවසානයේ ඉක්මන් ප්‍රථිඵලයක් නොලැබුණද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආකල්ප කෙරෙහි යම් ප්‍රමාණයක බලපෑමක් ඉන් ඇති වූයේ ය.

පසුගිය සතියේ කොළඹ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට එම පක්ෂයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙක් සිරුරට ගිනි තබාගෙන මිය ගියේය. අහිංසක දරු පවුල්කාරයෙකු වූ ඔහුගේ එම ක්‍රියාවෙන් පාඩු සිදුවූයේ පක්ෂයට නොව ඔහුට සහ එම පවුලේ අයටය. එය හොඳ ක්‍රියාවක්ද නැත්නම් මෝඩ ක්‍රියාවක්ද යන්න ඔහුගේ අදහස් හා ඒ මොහොතේ මානසිකත්වය ගැන නොදන්නා මට තීරණය කළ නොහැකි ය. කිව හැක්කේ මෙපමණය. හැම දෙයක්ම පමණට කළ යුතු ය. දේශපාලනය ගැන ද එසේම ය.

**ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය වේත්‍රධාරි**

♦ **මේජර් වී. බී. කරුණාරත්න**
**Oxford UK**
**( Major V. B. Karunaratne Ex Deputy Sergeant-At-Arms in Sri Lanka Parliament )**